# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2183/22 - 2020 ජූලි මස 07 වැනි අඟහරුවාදා - 2020.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

1. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
2. ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති
3. වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා
   නාවික හමුදාපති
4. එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මැතිතුමා
   ගුවන් හමුදාපති
5. සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති
6. මේජර් ජනරාල් (විශ්‍රාමික) විජිත රවිප්‍රිය මැතිතුමා
   රේගු අධ්‍යක්ෂ ජනරාල්
7. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස් මැතිතුමා
   ජාතික බුද්ධි ප්‍රධානී
8. මේජර් ජනරාල් සුරේෂ් සලේ මැතිතුමා
   අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි තොරතුරු සේවාව
9. මේජර් ජනරාල් ඒ.එස්. හේවාවිතාරණ මැතිතුමා
   අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අංශය
10. කපිතාන් එස්.ජේ. කුමාර මැතිතුමා
    අධ්‍යක්ෂ, නාවික හමුදා බුද්ධි අංශය
11. එයාර් කොමදෝරු එම්.ඩී.ජේ.වාසගේ මැතිතුමා
    අධ්‍යක්ෂ, ගුවන් හමුදා බුද්ධි අංශය
12. නියෝජ්‍ය පොලිස්පති ටී.සී.ඒ. ධනපාල මැතිතුමා
    පොලිස් විශේෂ කාර්යාංශය
13. නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මැතිතුමා
    අණදෙන නිලධාරී, විශේෂ කාර්ය බලකාය

වෙත,

ශුභාශිංසන පූර්වකව !

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.06.02 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

එම කාර්ය සාධක බලකායේ විෂයය නිර්ණය සහ රාජකාරී අදාළත්වය පිළිබඳව සලකා බලා උක්ත සාමාජිකයින්ට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියෝජනයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්. එම්. ටී. එන්. උපුල්දෙණිය මැතිතුමා, එතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටවනු ලැබූ සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයෙක් ලෙස මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජුනි මස 30 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.